**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය - 2022**

**-------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ ("අධිකාරිය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) LKAS 16 හි 16 (ආ) ඡේදයට අනුව, දේපල, පිරියත සහ උපකරණ අයිතමයක පිරිවැය, කළමනාකරණය විසින් අදහස් කරන ආකාරයට වත්කම් එහි ක්‍රියාත්මක වීමට හැකි වීමට අවශ්‍ය ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ඕනෑම පිරිවැයක් ඇතුළත් වේ.. ඒ අනුව, යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපලේ .ක්‍රියාකාරිත්වය 2022 දෙසැම්බර් 12 දින ආරම්භ කර තිබුණද, ඒ සඳහා දරන ලද රු.446,509,332 ක් වූ මුදල දේපළ, පිරියත සහ උපකරණ යටතේ ගිණුම්ගත නොකර නොනිමි වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. | යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදිකිරීම සඳහා ගෙවීම් තවමත් අවසන් කර නොමැති අතර වත්කම් දේපළ, පිරියත හා උපකරණ යටතට ගැනීම සඳහා වැඩ නිම කළ සහතිකයක් නිකුත් කර නොමැත. | යාපනය ගුවන් තොටුපලේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇත. LKAS 16 අනුව, පාලන අවදානම සහ වත්කම්වල ප්‍රතිලාභ අධිකාරිය වෙත පැවරූ විට, ඒවා දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) LKAS 16 හි 34 වන ඡේදයට අනුව, දේපළ, පිරියත හා උපකරණ සෑම වසර 03 කට හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතුය. කෙසේ වෙතත්, 2002 වසරේ සිට 2019 වසර දක්වා රු.576,826,244 ක වියදමින් අත්පත් කරගත් ඉඩම් අධිකාරිය විසින් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් පමණක් ක්ෂය කර ඇත. 2023 වසර තුළ ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරනු ඇත. | අධිකාරිය LKAS 16 ට අනුකූල විය යුතුය. |
| (ඇ) LKAS 16 හි 36 වන ඡේදයට අනුව, දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන්නේ නම්, එම වත්කම අයත් වන දේපළ, පිරියත හා උපකරණ සම්පූර්ණ පන්තියම ප්‍රත්‍යාගණනයට ලක් කෙරේ. කෙසේ වෙතත්, වත්කම් පන්තියේ කොටසක් පමණක් නැවත තක්සේරු කර තිබුණු අතර ප්‍රත්‍යාගණනය කළ වත්කම් පන්තියට අයත් රු.218,533,616 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | 2020 වාර්තාවේ විගණකාධිපතිවරයා නිරීක්ෂණය කළේ “අධිකාරිය විසින් සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර නොමැති” බවයි. ඒ අනුව සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් පමණක් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන ලදී. ඔබගේ නිරීක්ෂණයට අනුව 2023 වර්ෂය තුළ ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරනු ලැබේ. | දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනයට ලක් කරන්නේ නම් සම්පූර්ණයෙන්ම ක්ෂය වී හෝ නැතත්, එම වත්කම අයත් වන දේපළ, පිරියත හා උපකරණ සම්පූර්ණ පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 වැනි ඡේදය අනුව, වත්කමක සුන්බුන් අගය සහ ඵලදායි ජීව ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම්, එම වෙනස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 8 ට අනුකූලව ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 දිනට අයිතම 614 කට අදාළව ධාරණ අගය රු.50,159,458 ක් වූ වත්කම් ප්‍රමිතිවලට අනුව සමාලෝචනය කර ගිණුම්ගත කර නොතිබුණි. | සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් පමණක් ක්ෂය කර ඇත. විගණන නිරීක්ෂණයට අනුව 2023 වර්ෂය තුළ ඉතිරි වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරනු ඇත. | LKAS 16 හි 51 ඡේදය අනුගමනය කළ යුතුය. |
| (ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 86 සහ 91 ඡේදවලට අනුව අධිකාරියට බාහිර පාර්ශ්ව විසින් සහ බාහිර පාර්ශ්වයන්ට එරෙහිව සමාගම විසින් පවරා ඇති නඩු සම්බන්ධයෙන් එක් එක් නඩුවේ මූල්‍ය බලපෑම සහ නඩු පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු වුවද, අධිකාරිය ඒ අනුව කටයුතු කර නොතිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට නඩු කටයුතු පහක් (5) පවතින බව නිරීක්ෂණය වූ නමුත් අධිකාරිය ඒවා ප්‍රමිතියට අනුව අනාවරණය කර නොතිබුණි. අභියාචනා පිරිවැයක් සඳහා රු.2,405,039 ක මුදලක් අධිකරණයේ තැන්පතු ලෙස අධිකාරිය වැය කර තිබුණ අතර එය නීතිමය වියදම් ලෙස වෙනම හඳුනා නොගෙන අනෙකුත් ණය ගැතියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | පිළිතුර ලබා දී නොතිබුණි. | LKAS 37 හි 86 සහ 91 ඡේද අනුගමනය කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක EL/01/2022 දරන නියමයෙහි 05 ඡේදයට අනුව, සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් සතිපතා ප්‍රකාශයට පත් කරන ලද විනිමය අනුපාතිකය අපගමන බද්ද (Embarkation Levy) පරිවර්තනය සඳහා භාවිතා කළ යුතුය. කෙසේ වෙතත්, පරිවර්තනය සඳහා විකුණුම් දිනයේ විනිමය අනුපාතිකය භාවිතා කළ යුතුය. නිවැරදි නොවන විනිමය අනුපාත යෙදීම හේතුවෙන්, අධිකාරිය විසින් 2022 මාර්තු 01 සිට ජූලි 15 දක්වා කාලය සඳහා සීමාසහිත ශ්‍රී | මෙම වැඩිපුර ගෙවීම ශ්‍රී ලංකන් ගුවන් සමාගම වැරදීමකින් සිදු කර තිබුණි. ශ්‍රී ලන්කන් ගුවන් සමාගමෙන් විශාල මුදලක් ලැබිය යුතුව ඇත. CAA විසින් හිඟ මුදල්වලට එරෙහිව වැඩිපුර ගෙවීම ඉවත් කිරීමට ගුවන් සමාගමෙන් එකඟතාවය ඉල්ලා ඇත. | අපගමන (Embarkation Levy) බද්ද නිවැරදිව ගණනය කර ඒ අනුව එකතු කර ගිණුම්ගත කළ යුතුය. |

ලන්කන් ගුවන් සමාගමෙන් රු.496,424,251.74 ක අතිරික්ත මුදලක් එකතු කර තිබුණි. මෙම වාර්තාවේ දිනය වන විටත් මෙම මුදල ප්‍රතිපූරණය කර නොතිබුණි. තවද, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අපගමන (Embarkation Levy) බද්ද මත සියය 2.5 ක් වූ සේවා ගාස්තු ආදායම රු.3,061,282.89 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ආරම්භක රඳවාගත් ඉපැයීම් | 4,029,697,348 | 7,731,684,323 | 3,701,986,977 | පිළිතුර ලබා දී නොතිබුණි. | වෙනස හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2008 මැයි 22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (විශේෂ) අංක 1550/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 07 සහ 08 රෙගුලාසි අනුව, ශ්‍රී ලංකාවෙන් ආරම්භ වන ගුවන් ගමන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරන ලද හෝ අලෙවි කරන සෑම මගී ප්‍රවේශපත්‍රයක් සම්බන්ධයෙන්ම ඇමෙරිකානු ඩොලර් 60 ක අධිභාරයක් හෝ එම මුදලට සමාන මුදලක් අය කළ යුතු අතර, එසේ අය කරනු ලබන අධිභාරය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. කෙසේ වෙතත්, 2008 වසරේ සිට 2022 වසර දක්වා කාලය තුළ එකතු කරන ලද රු.16,981,667,778 ක් වූ අධිභාරය අධිකාරිය විසින් ඒකාබද්ධ අරමුදලට බැර නොකට අධිකාරියේ ආදායම ලෙස හඳුනාගෙන තිබුණි. තවද, 2002 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලය තුළ එකතු කරන ලද අධිභාර ඒකාබද්ධ අරමුදලට බැර කර තිබේද යන්න සොයා බැලීම සඳහා විගණනය සඳහා තොරතුරු නොවීය. | සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා (DGCA) මෙම පනතේ 12 (2) (ඇ) වගන්තියට අනුව කටයුතු කර ඇති අතර, අධිකාරියේ අරමුදලට විදේශීය විකුණුම් අධිභාරය ලෙස ගුවන් සමාගමෙන් එකතු කරන ලද මුදල් බැර කර ඇත. අධිකාරියේ අරමුදල හැර භාණ්ඩාගාරයට එකතු කිරීම සහ සෘජුවම ප්‍රේෂණය කිරීම සඳහා කිසිදු එකතු කිරීමේ ගිණුමක් පවත්වාගෙන යාමට DGCA හට බලතල නොමැත. ඉහත අධිභාරය, කිසිදු මුදල් පනතක් යටතේ ගැසට් කර නොමැති ගාස්තු හෝ බදු නොවන බැවින් 2008 වර්ෂයේ සිට 2022 දක්වා අධිකාරියට ලැබුණු රු.16,981,667,778 ක් වූ OSS ආදායමේ එකතුව අධිකාරියට ලංද ආදායමක් ලෙස සලකා අද දක්වා ආදායම් ප්‍රකාශනවල නියෝජනය කර ඇත. CAASL විසින් 1971 අංක 38 දරන මුදල් පනතේ 10(5) වගන්තිය ප්‍රකාරව "රාජ්‍ය සංස්ථාවේ ශුද්ධ අතිරික්ත ආදායමෙන් වෙන් කිරීම" | ගැසට් පත්‍රයට අනුව සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති ආකාරයට මගී ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරන හෝ අලෙවි කරන සෑම ගුවන් සමාගමකින් අධිභාරය අය කර ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය. ඒ අනුව සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ආකාරය ප්‍රකාශ කළ යුතුය. |

| | | |
|---|---|---|
| | මේ දක්වා උල්ලංඝනය නොකට මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර ඇත. | |
| (ආ) අධිකාරියේ අත්පොතෙහි 14.5.1 සහ 14.8.2 (IV) වගන්තියට අනුව දේපල සහ වාහන ණය සඳහා පොලී අනුපාතය සියයට 7 කි. කෙසේ වෙතත්, අධිකාරියේ අත්පොත ක්‍රියාත්මක වීම ආරම්භයේදී දේපල ණය සහ වාහන ණය සඳහා සියයට 4.2 ක් පමණක් අය කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු.2,108,585 ක ණය පොලී ආදායම අධිකාරියට අහිමි වී තිබුණි. | අධිකාරී මණ්ඩලය පොලී අනුපාතය සියයට 4.2 දක්වා අඩු කිරීමට තීරණය කළේය. 1.10 A වගන්තියට අනුව, SLCAP 5000 හි ඕනෑම කොටසක් මහා භාණ්ඩාගාරයේ සාමාන්‍ය සමාලෝචනයට යටත් නොවන කරුණක් සංශෝධනය කිරීමට මණ්ඩලයට බලය ඇති අතර අධිකාරිය විසින් ණය මුදල් ප්‍රමාණය සංශෝධනය කිරීම සඳහා පමණක් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වේ. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලත් අත්පොත අවශ්‍ය යැයි සලකන විට අධිකාරිය විසින් සංශෝධනය කළ හැකි අතර එම සංශෝධන ක්‍රියාත්මක කිරීමට පෙර අත්පොතේ 1.10 වගන්තිය අනුව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය අවශ්‍ය වේ. |
| (ඇ) සෑම ගුවන් සමාගමකින්ම අපගමන (Embarkation Levy) බද්ද එකතු කිරීම සඳහා සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද අංක එල්/01/2022 නියමයෙහි දක්වා ඇති ආකෘතිය භාවිතා කර නොතිබුණි. එබැවින්, එක් එක් ගුවන් සමාගම විසින් එවන ලද අපගමන (Embarkation Levy) බද්දේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට සහ තහවුරු කර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය තුළ ගුවන් ටිකට්පත් අලෙවි කර ප්‍රේෂණය කළ රු.1,650,432,347 ක් වූ බද්දේ නිවැරදිතා◌ාවය හා ටිකට්පත් කළ දිනය තහවුරු කර ගැනීමට නොහැකි විය. | CAA විසින් ටිකට්පත් නිකුත් කරන දිනය ඇතුළත් ආකෘතියක් හඳුන්වා දෙන ලදී. නමුත් එයාර්ලයින් පද්ධතියෙන් එම වාර්තාව ජනනය කිරීම අපහසු බව ගුවන් සේවය දැනුම් දී ඇත. එබැවින් නැවිගත කිරීමේ බද්ද එකතු කිරීම සහ තහවුරු කර ගැනීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් "Embarkation Levy Management System" නමින් පූර්ණ ස්වයංක්‍රිය පද්ධතියක් සංවර්ධනය කරමින් සිටී. මෙම පද්ධතිය 2023 වසර තුළ සම්පූර්ණ කරනු ලැබේ. | අධිකාරිය විසින් විධිමත් යාන්ත්‍රණයක් හරහා එක් එක් ගුවන් සමාගම විසින් ප්‍රේෂණය කරනු ලබන අපගමන (Embarkation Levy) බද්දේ නිරවද්‍යතාවය පරීක්ෂා කර තහවුරු කළ යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 1,196,747,459 | ශේෂ සනාථ කිරීමේ ලිපි | විගණන අධිකාරීවරයාට පිටපතක් සහිතව ශේෂ තහවුරු කිරීම් එවන ලෙස ඉල්ලා අධිකාරිය සියලුම ණය ගැතියන්ට සහ ණය හිමියන්ට ලිපි යවා ඇත. | තහවුරු නොකළ ණය ගැතියන් සහ ණය හිමියන් පිළිබඳ පසු විපරම් සිදු කළ යුතුය. |
| (ආ) වෙළඳ ලැබිය යුතු දෑ | 1,524,761,412 | | | |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දින දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු එකතු කළ අගය මත බද්ද (ආදාන බද්ද) රු.255,416,974 කි. මුදල් ආපසු ලබා ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිහිපයක් පැවැත්වුවද අවසන් තීරණයක් ගෙන නොතිබුණි. එබැවින් මෙම ආදාන බද්ද අයකර ගැනීමේ හැකියාව සැක සහිතය. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හානිකරණය හෝ හෙළිදරව් කිරීම් සඳහා ප්‍රතිපාදන කිසිවක් සිදු කර නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දැනටමත් 2016 වසර දක්වා වැට් බදු විගණනය අවසන් කර රු.මිලියන 51 ක මුදල් ආපසු ගෙවීමේ දැන්වීම් නිකුත් කර ඇත. මහා පරිමාණ බදු ගෙවන්නන්ගේ ඒකකය (LTU 6) 2016 වසරට පසුව විගණන ක්‍රියාවලිය ආරම්භ කළේය. | වැට් බදු ආපසු ගෙවීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් තහවුරු කර ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අපගමන (Embarkation Levy) බද්දේ සේවා ගාස්තුව මත රු.1,567,314 ක සමාජ ආරක්ෂණ දායක බද්දක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වුවද, මේ සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමක් හෝ ගෙවීමක් සිදු කර නොතිබුණි. | රජය විසින් පනවන ලද ව්‍යවස්ථාපිත ගාස්තු SSCL සඳහා වගකිව යුතු නොවන බැවින් අපගමන (Embarkation Levy) බද්දේ සේවා ගාස්තුව සඳහා SSCL ගෙවීම වගකිව නොබදේ. තවද, මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව අපගමන (Embarkation Levy) බද්ද යනු වැට් සහ SSCL සඳහා වගකිය නොහැකි රජයේ බද්දක් බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට තහවුරු කර ඇත. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අංක ACT 3/25 සහ 2022 ඔක්තෝබර් 18 දිනැති ලිපියට අනුව අධිකාරියේ පිරිවැටුම ලෙස සැලකෙන අපගමන (Embarkation Levy) බද්දේ පිරිවැටුම සහ සේවා ගාස්තු සම්බන්ධයෙන් SSCL 2.5% අදාළ වේ. එබැවින් අධිකාරිය විසින් රු.1,567,314 ක් වූ සමාජ ආරක්ෂණ දායක බද්ද ගෙවිය යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම<br>රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත | | | |
| (i) 7 (ඇ) වගන්තිය | ශ්‍රී ලංකාව සඳහා වන ගුවන් සේවා සංවර්ධන සැලැස්ම අධිකාරිය විසින් සකස් කළ යුතු වුවද මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් එය සකස් කර නොතිබුණි. | ජාතික ගුවන් සේවා සංවර්ධන සැලැස්මේ පළමු කෙටුම්පත වරාය, නාවික සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා වෙත භාරදී ඇති අතර එය පාර්ශ්වකරුවන්ගේ අදහස් සඳහා CAA වෙබ් අඩවියේ පළ කර ඇත. | අධිකාරිය 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරි පනත අනුව කටයුතු කළ යුතුය. |
| (ii) 9 වගන්තිය | පනතේ දෙවන උපලේඛනයේ සඳහන් ගුවන් තොටුපළවල් 14 ක් සහ තුන්වන උපලේඛනයේ සඳහන් ගුවන් යානා පහසුකම් 08 ක් සහ ඊට අදාළ ඉඩම පැවරීමේ නියෝගය, 2016 වන විටත් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. පනත බලාත්මක වී වසර 15 ක් ඉක්ම ගොස් තිබුණද, 2017 දී ගුවන් තොටුපළවල් 02 ක් සහ ගුවන් පහසුකම් 07 ක් සහ කටුනායක සහ රත්මලාන ගුවන් තොටුපළට අදාළ ඉඩම අධිකාරියට පවරා දීමට නියමිත බව සඳහන් කරමින් ගැසට් නිවේදනයක් ප්‍රකාශයට පත් කර ඇත. තවද පලාලි ගුවන් තොටුපළ හා මඩකලපුව ගුවන් තොටුපළ සම්බන්ධ ගැසට් පත්‍රය පිළිවෙළින් 2019 සහ 2022 දී ප්‍රකාශයට පත් කර තිබුණි. 2023 මැයි 15 දිනට වසර 21 ක් ගතවී ඇතත් පනතේ සඳහන් ඉතිරි ගුවන් තොටුපළ ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යවරයා විසින් එම දේපළ ගැසට් පත්‍රයේ පළ කරන තුරු තුන්වැනි උපලේඛනයේ සඳහන් දේපළවලට අදාළ කිසිදු ක්‍රියාමාර්ගයක් ගත නොහැක. 2017 දී ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍රයට පසුව, පැවරීමේ සහ මාරු කිරීමේ ක්‍රියාවලියේ පරිපාලන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා CAASL විසින් ක්‍රියාමාර්ග මාලාවක් ගෙන ඇත. මායිම් නැවත ගැසට් කිරීමට සහ රාජ්‍ය ප්‍රදානයක් ලෙස දේපළ ලබාගැනීමට අවශ්‍ය පරිපාලන කටයුතු සිදුවෙමින් පවතින අතර විවිධ රාජ්‍ය සංවිධානවල මැදිහත්වීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග මාලාවක් ගත යුතුව ඇති බැවින් ඇතිව ඒ සඳහා ඒ සඳහා තවත් දීර්ඝ කාලයක් ගතවේ. | පනත බලාත්මක වී වසර 15 ක් ගතවී පළමු ගැසට් නිවේදනය 2017 දී ප්‍රකාශයට පත් කර ඇත. 2023 මැයි 15 දිනට වසර 21 ක් ගතවී ඇතත් වත්කම් පැවරීමේ ක්‍රියාපටිපාටිය පූර්ණ වශයෙන් සම්පූර්ණ කර නොතිබුණු බැවින් අධිකාරිය වත්කම් පැවරීම කාර්යක්ෂමව කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) 12 වගන්තියේ (1), (2), (3) | පනතේ 12 (1) වගන්තියට අනුව, සිවිල් ගුවන් සේවා අධිකාරියට සතුව අරමුදලක් තිබිය යුතු අතර 12 (2) වගන්තියෙහි (අ), (ආ), (ඇ), (ඈ) හා (ඉ) හි ගාස්තු, ණය, පරිත්‍යාග, තෑගි සහ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලුම මුදල් අරමුදලට අය කළ යුතුය. පනතේ 3 වගන්තියට අනුව දරන ලද වියදම් හා 12(3) වගන්තියේ (අ), (ආ) හා (ඇ) හි සඳහන් දායකත්වය අරමුදලින් ගෙවිය හැකිය. කෙසේ වෙතත්, අධිකාරිය විසින් 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරී පනතට අනුව වෙනම අරමුදලක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ඉහත සඳහන් කළ ආදායම් හා වියදම් ගිණුම්ගත කිරීමට හෝ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අරමුදල් ගිණුමේ ක්‍රියාකාරකම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ දැක්වේ. අරමුදල් ගිණුමේ ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ අයිතිය වෙනස්වීංමේ ප්‍රකාශනයේ "රඳවා ගත් ඉපැයීම්" ලෙස පෙන්වයි. 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරී පනතේ අංක 12 (2) වගන්තිය අනුව තමන්ගේම අරමුදල හැර වෙනම අරමුදලක් පවත්වාගෙන යාමට අධිකාරියට විධිනියෝගයක් නොමැත. | CAASL පනතට අනුව වෙනම අරමුදලක් පවත්වාගෙන යා යුතුය. |
| (ආ) 2021 නොවැම්බර් 17 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| (i) 2.3 වගන්තිය | CAASL හි ක්‍රියා පටිපාටි අත්පොත් අවම වශයෙන් වසර 5කට වරක්වත් සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය. කෙසේ වෙතත්, එම චක්‍රලේඛය පරිදි අත්පොත් 44 ක් සමාලෝචනය කර යාවත්කාලීන කිරීමට අධිකාරිය අසමත් වී තිබුණි. | රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 2.3 වගන්තියේ වසර 05 ක් සඳහන් නොවේ. කෙසේ වෙතත්, 2022 අප්‍රේල් 02 වැනි දින පැවති 180 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ගත් තීරණයට අනුව, අත්පොත සමාලෝචනය කර, කමිටුවේ සොයාගැනීම් සහ නිර්දේශ වැඩිදුර සැකසීම සඳහා යොමු කර ඇත. අදාළ ICAO ප්‍රකාශන යාවත්කාලීන කරන විට පමණක් තාක්ෂණික අංශවල අත්පොත් සංශෝධනය/සංශෝධනය කරනු ලැබේ. | අධිකාරිය චක්‍රලේඛයට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 3.2 වගන්තිය | චක්‍රලේඛ විධිවිධානයට පටහැනිව, රු.10,062,500 ක් වූ වෘත්තීය දීමනා, රු.13,800,000 ක් වූ කළමනාකරණ දීමනා සහ රු.43,147,983 ක් වූ අතුරු දීමනා ලෙස එකතුව රු.74,397,483 ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අධිකාරියේ කාර්යය මණ්ඩලයට ගෙවා තිබුණි, | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෘත්තීය (තාක්ෂණික) දීමනා අනුමත කර ඇත. 2003 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරී පනත මගින් පැවරී ඇති බලතල අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනෙකුත් දීමනා අනුමත කර ඇත. | විගණන ඡේදයේ සඳහන් දීමනා සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත යුතුය. |
| (iii) 3.11 වගන්තිය | 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරී පනතේ තුන්වන උපලේඛනයේ සඳහන් ගුවන් තොටුපළවල් 14 සහ දෙවන උපලේඛනයේ සඳහන් ගුවන් යානා පහසුකම් 08 සහ ඊට අදාළ ඉඩම සම්බන්ධ සියලු දේපළ පැවරීම අධිකාරියේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් වන අතර රජය සතු ආයතනයක මූලික ක්‍රියාකාරකම් බාහිරින් ලබා ගත නොහැකි විය. කෙසේ වෙතත් එම චක්‍රලේඛයට අනුව කටයුතු නොකට අධිකාරිය විසින් නම් කරන ලද නිලධාරියෙකු (Designated Officer) පත් කර තිබුණි. තවද, චක්‍රලේඛ අංක 01/2021 යටතේ නිකුත් කර ඇති අත්පොතේ 3.11 වගන්තියට අනුව බාහිර හවුල්කරුවන් තෝරා ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිවලට අනුකූලව සිදු කළ යුතුය. කෙසේ වෙතත්, 2022 මාර්තු 02 සිට 2023 මාර්තු 01 දක්වා කාලය සඳහා නම් කරන ලද නිලධාරියා තෝරා ගැනීමේදී සහ පත් කිරීමේදී අධිකාරිය | 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරී පනතේ II කොටසේ 7 වැනි වගන්තියේ (u) සහ (v) උප වගන්තිවල පැහැදිලිව සඳහන් කර ඇති පරිදි උපදේශකවරුන්ගේ සහ උපදේශකයන්ගේ සේවය මෙම අධිකාරියට පත් කර ඒ සඳහා ගෙවීම තීරණය කළ හැකිය. එම නීතිමය ප්‍රතිපාදන මත පදනම්ව, CAASL හි 180 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ අනුමැතියෙන් එකී නම් කරන ලද නිලධාරියා පත් කර ඇත. | අධිකාරියට දේපල පවරා ගැනීමේ සම්පූර්ණ ක්‍රියාවලියම අධිකාරියේ මූලික ක්‍රියාකාරකම් බව පෙනේ. එබැවින් අධිකාරිය චක්‍රලේඛය අනුව ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කර නොතිබුණි. | | |
| (ඇ) 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3 (x) වගන්තිය | 2022 අප්‍රේල් 26 දින සිට මාණ්ඩලික නිලධාරීන්ට ලබාදී තිබූ ණය පහසුකම් අත්හිටුවා තිබුණද, අධිකාරියේ මාණ්ඩලික නිලධාරීන් 60 දෙනෙකුට රු,33,414,981 ක ණය මුදල් අධිකාරිය විසින් ලබා දී තිබුණි. | මෙම අත්හිටුවීම අදාළ වන්නේ 2022 වසර සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම යටතේ ණය පහසුකම් ලබාදීම සඳහා පමණක් බව චක්‍රලේඛයේ පැහැදිලිව සඳහන් කරයි. මෙම අධිකාරිය තම සේවකයන්ට ණය පහසුකම් ලබාදීම සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් මත රැඳී නොමැති බව අවධාරණය කිරීමට කැමැත්තෙමි. ඒ හේතුවෙන් චක්‍රලේඛයේ සඳහන් වගන්තිය මෙම අධිකාරියට අදාළ නොවේ. | මෙම චක්‍රලේඛය රාජ්‍ය සංස්ථා වෙතද යොමු කර ඇති අතර චක්‍රලේඛයේ විධිවිධාන අනුව මාණ්ඩලික නිලධාරීන්ට ලබාදී තිබූ ණය පහසුකම් අත්හිටුවා තිබුණි. අත්පොත යාවත්කාලීන කළ යුතුය. |
| (ඈ) මුදල් රෙගුලාසි (i) 215 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවා ලබා ගැනීමට පෙර රු.12,509,901 ක ශේෂයක් ගෙවා තිබුණි. එම මුදලින් පිරියත හා යන්ත්‍රෝපකරණ නඩත්තු සඳහා රු.1,664,056 ක් ගෙවා තිබුණු අතර මෙම පෙරගෙවීම වසරකට වැඩි කාලයක් පැවති නමුත් මේ දක්වා කාර්යය නිම කර නොතිබුණි. | මේවා වසරකට වැඩි කාලයක් පවතින සේවා ගිවිසුම් සඳහා කරන ලද පූර්ව ගෙවීම් වේ. | අධිකාරිය මුදල් රෙගුලාසි 215 අනුව කටයුතු කළ යුතුය. |
| (ii) 571 | 2022 ජනවාරි 01 දිනට තෙවන පාර්ශව වෙතින් ලැබුණු තැන්පතු මුදල රු.1,768,635 ක් වූ අතර ඉන් රු.1,283,544 ක් තැන්පතු හිමියන්ගෙන් විමසීමකින් තොරව සහ ඔවුන් ඉල්ලීම් නොකරන බව තහවුරු කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී විවිධ ආදායම්වලට මාරු කර තිබුණි. | මෙම අධිකාරියට විවිධ අනුමත කිරීම් සඳහා විදේශ ප්‍රේෂණ ලැබෙන අතර, විනිමය අනුපාත වෙනස්කම් සහ බැංකු ගාස්තු සඳහා සේවාලභීන් අමතර මුදල් එවනු ලබයි. එම සේවාලභීන් එම අමතර මුදල් නැවත ලබා ගන්නේ නැත. CAA විසින් එම මුදල් "පොදු තැන්පතු" ගිණුමක තවත් වසරක් එම ගනුදෙනුකරුවන්ගෙන් යම් පාඩුවක් අයකර ගැනීමට වෙනම් තබා ගන්නා අතර සහ ඒවා විවිධ ආදායම් වෙත මාරු කරනු ලබයි. | අධිකාරිය මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) මාණ්ඩලික සහ පරිපාලන රීති අත්පොතෙහි 13.3 වගන්තිය | මූල්‍ය රෙගුලාසි 755 අනුව රජයේ යම් දේපලක භාරකාරත්වය වෙනත් ආකාරයකින් පවරා ඇති ඕනෑම නිලධාරියෙකු තම රාජකාරිවලින් ඉල්ලා අස්වීමට පෙර, ඔහු තම අනුප්‍රාප්තිකයාට භාර දිය යුතුය. කෙසේ වෙතත්, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අධිකාරියේ අත්පොතෙහි විධිවිධාන අනුව, සේවකයෙකුට නිල භාවිතය සඳහා නිකුත් කරන ලද උපකරණ ඔහු විශ්‍රාම යාමේදී හෝ අධිකාරියෙන් ඉවත්ව යාමේදී විකිණීමට හැකිය. ඒ අනුව එම නිලධාරීන්ට කිසිදු උපකරණයක් පැවරීමක් කර නොතිබුණද නිලධාරීන් තිදෙනෙකු අධිකාරියෙන් ඉවත්ව යාමේදී ලැප්ටොප් පරිගණක තුනක් නිකුත් කර තිබුණි. | අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද CAASL හි මාණ්ඩලික නීති සහ පරිපාලන අත්පොතෙහි 13.1 වගන්තිය යටතේ අධිකාරියට ප්‍රතිපාදන සලසා දී ඇත. | අත්පොතට අනුව නිල භාවිතය සඳහා සේවකයෙකුට නිකුත් කරන ලද උපකරණ විකිණිය හැකිය. එම නිසා එම උපකරණ හිමිවිය යුතු නිලධාරීන්ට පැවරී තිබිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,743,243,673 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.329,898,389 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,413,345,284 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම රු.3,140,052,967 කින් වැඩි වීම හා වෙනත් මෙහෙයුම් ආදායම් රු.460,516,143 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| | 2022 | 2021 | Variance | % |
|---|---|---|---|---|
| | -------- | ----- | ---------- | ---- |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| **මෙහෙයුම් ආදායම්** | 3,685,224,914 | 993,344,282 | 2,691,880,632 | 271 |
| විදේශ විකුණුම් මත වූ අධිභාරය | 3,376,434,208 | 892,315,495 | 2,484,118,713 | 278 |
| අපගමන බද්ද මත සේවා ගාස්තුව | 227,543,076 | 33,339,951 | 194,203,125 | 582 |
| නියාමන සේවාවලින් ලැබෙන ආදායම | 81,247,630 | 67,688,837 | 13,558,793 | 20 |
| **මෙහෙයුම් නොවන ආදායම** | 583,077,759 | 134,905,424 | 448,172,335 | 332 |

| | | | | |
|---|---|---|---|---|
| **මුළු ආදායම** | **4,268,302,673** | **1,128249,706** | **3,140,052,967** | **278** |
| **කාර්ය මණ්ඩල වියදම්** | 457,965,055 | 356,754,794 | 101,210,261 | 28 |
| **පරිපාලන සහ අනෙකුත් වියදම්** | 260,886,367 | 195,510,215 | 65,376,152 | 33 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පෙර වසර හා සසඳන විට, සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු.3,140,052,967 කින් එනම් සියයට 278 කින් වැඩි වී ඇත. විදේශ විකුණුම් මක වූ අධිභාරය රු.3,276,434,208 ක් ඒකාබද්ධ අරමුදලට බැර නොකර අධිකාරියේ ප්‍රධාන ආදායම ලෙස සලකා ඇත. මෙම ආදායම පෙර වසරට සාපේක්ෂව රු.2,484,118,713 කින් එනම් සියයට 278 කින් වැඩි වී ඇත.

(ii) පෙර වසරට සාපේක්ෂව කාර්ය මණ්ඩල සහ පරිපාලන වියදම් පිළිවෙලින් රු.101,210,261 කින් සහ රු.65,376,152 කින් වැඩි විය.

**2.3 අනුපාත විශ්ලේෂණය**

| | 2022 | 2021 |
|---|---|---|
| | ------ | ------ |
| ජංගම අනුපාතය | 1: 2.34 | 1:2.05 |
| ශුද්ධ ලාභ අනුපාතය | 64% | 29% |
| ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය | 42% | 7% |

(i) 2021 වර්ෂයේ ජංගම අනුපාතය 1:2.05 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂය අවසන් වන විට 1:2.34 දක්වා වැඩි වී තිබුණි. භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය රු.1,958,516,968 කින් ඉහළ යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

(ii) අධිකාරියේ ආදායම වැඩිවීම නිසා ශුද්ධ ලාභ අනුපාතය වැඩි වී තිබුණි.

(iii) පෙර වසරට සාපේක්ෂව ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය සියයට 42 කින් වැඩි වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) අධිකාරියේ කාර්ය මණ්ඩල සහ පරිපාලන රීති අත්පොතෙහි 1.4 වගන්තියට අනුව, CAASL හි ආයතනික පාලනයේ ප්‍රධාන කොටස් තුනකින් එනම් කාර්ය මණ්ඩල සහ පරිපාලන නීති, ආයතනික නීති සහ මූල්‍ය නීති සමන්විත වේ. අත්පොත අනුව ආයතනික නීති, මූල්‍ය නීති වෙන වෙනම නිකුත් කළ යුතු වුවද, මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් එම නීති නිකුත් කර නොතිබුණි. | ආයතනික නීති නිකුත් කර ඇත. මූල්‍ය රීති කෙටුම්පත් කර ඇති අතර අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව නිකුත් කරනු ලැබේ. | අධිකාරියේ කාර්ය මණ්ඩල සහ පරිපාලන රීති අත්පොතෙහි 1.4 වගන්තිය අනුව අධිකාරිය කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ තුන්වන උපලේඛනයට ඇතුළත් ගුවන් යානා පහසුකම් සහ ඉඩම්, බදු ගිවිසුමකින් තොරව සහ කුළිය අය කිරීමකින් තොරව ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්ගලික) සමාගමට භාවිත කිරීම සඳහා අවසර ලබා දී තිබුණි. | මෙම ඉඩම්වල අයිතිය තවමත් CAA වෙත පැවරී නැත. දේපල බදු දීමට හෝ කුළියට දෙනු ලබන්නේ ඉන් පසුවය. | අධිකාරිය ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්ගලික) සමාගම සමඟ බදු ගිවිසුමකට එළැඹිය යුතු අතර තුන්වන උපලේඛනයට ඇතුළත් ගුවන් යානා පහසුකම් සහ ඉඩම් සඳහා කුළිය අය කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලැබිය යුතු අත්තිකාරම් මුදල රු.173,958,796 ක් පියවීමකින් තොරව වසරකට වැඩි කාලයක් පැවතුනි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා සමාගම මෙම අත්තිකාරම් පියවා නැත. | නියමිත කාල සීමාව තුළ හෝ අදාළ වැඩසටහන අවසන් වීමෙන් පසුව අත්තිකාරම් පියවිය යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගුවන් තොටුපළ 14 ක් සහ ගුවන් යානා පහසුකම් පැවරීම සම්බන්ධයෙන් CAASL සහ නම් කරන ලද නිලධාරියා අතර අත්සන් කරන ලද ගිවිසුමට අනුව, නම් කරන ලද නිලධාරියා අවම වශයෙන් පැය හතරක් සේවය කර ඇත්නම්, සම්පූර්ණ කරන ලද සෑම පැයකටම රු.2,000 ක මුදලක් ගෙවිය යුතුය. කෙසේ වෙතත්, නිලධාරියා ක්ෂේත්‍ර සහ අනෙකුත් කාර්යාලවල සිය රාජකාරි ආවරණය කර ඇති බැවින් ඉහත සඳහන් කළ පරිදි නම් කරන ලද නිලධාරියා ක්‍රියා කර ඇත්ද යන්න සහතික කර ගැනීමට නොහැකි විය. තවද, පැමිණීම සහ ඉටු කරන ලද කාර්යය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණු බැවින්, නම් කරන ලද නිලධාරියාට රු.13,000,000 ක් වූ ගෙවීම් පිළිබඳව නිවැරැදිතාවය තහවුරු කර ගත නොහැකි විය. තවද, ගිවිසුමට පටහැනිව ප්‍රවාහන වියදම් රු.92,340 ක් ප්‍රතිපූරණය කර තිබුණි. | නම් කරන ලද නිලධාරීන් පැමිණීම සලකුණු කිරීමට අවශ්‍ය නොවන අතර ඔවුන්ගේ වැඩ පැවරුම් සම්පූර්ණ කිරීම අංශ ප්‍රධානීන් විසින් අධීක්ෂණය කර සහතික කරනු ලැබේ. විශේෂයෙන්ම මේ නිලධාරියාට පැවරුණු කාර්යය කාර්යාල කාමරයකට සීමා කර නිම කළ නොහැක. මණ්ඩලය මාසයකට පැය 120 ක් අනුමත කර ඇත. 2022.04.11 දින අත්සන් කරන ලද ගිවිසුමේ 6 වැනි වගන්තිය සංශෝධනය කරන ලද අතර අවශ්‍ය විටෙක CAASL මගින් ප්‍රවාහනය සැපයිය යුතුය. | කාර්ය පදනම මත ගෙවීම් සිදු කර නොතිබුණු අතර වැඩ කළ කාලය මත ගෙවීම් කර තිබුණි. එබැවින් වැඩ කරන වේලාවන් තහවුරු කිරීම සඳහා පැමිණීම පවත්වා ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2016 ජාතික අයවැයෙන් අභ්‍යන්තර ගුවන් ප්‍රවාහනය වැඩිදියුණු කිරීමේ අරමුණින්, PPP විධිවිධාන හරහා දිගන, බදුල්ල සහ පුත්තලම යන ස්ථානවල නව අභ්‍යන්තර ගුවන් තොටුපළ තුනක් ස්ථාපිත කිරීමට සැලසුම් කරන ලදී. ඒ අනුව, බදුල්ල ගුවන් තොටුපළ සඳහා වන සමීක්ෂණ සැලසුම් සහ පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) සකස් කිරීම සඳහා 2022 දෙසැම්බර් 31 දින වන විට අධිකාරිය විසින් රු.2,013,605 ක් ගෙවා තිබුණු අතර වර්තමානය වන විට මෙම ගුවන් තොටුපළවල් තුනේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබුණි. | CAA විසින් රජයේ ප්‍රතිපත්ති තීරණ ක්‍රියාත්මක කළ අතර රජය වෙනස්වීම හේතුවෙන් සංවර්ධන කටයුතු ඉදිරියට ගොස් නොමැත. | සංවර්ධන කටයුතු ප්‍රගතිය සමාලෝචනය කළ යුතුයි. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අංක 09 නිල නිවාසය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය ඇස්තමේන්තුව රු.15,000,000 ක් වූ අතර ජාතික තරගකාරී ලංසු ක්‍රමය යටතේ ලංසු කැඳවීමේදී රු.282,554 ක දැන්වීම් ගාස්තුවක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, නිල නිවාසය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අධිකාරිය කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගෙන නොතිබුණු අතර, අධිකාරියේ කාර්ය මණ්ඩලයේ තාක්ෂණික සහයක යටතේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ දී ප්‍රතිසංස්කරණය සඳහා දරන ලද වියදම රු.2,666,818 ක් වූ අතර මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | ජාතික තරගකාරී ලංසු තැබීමේ ක්‍රමය යටතේ අංක 09 නිල නිවාසය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ලංසු කැඳවන ලද අතර, TEC රු.මිලියන 36.5 ක් ඉදිරිපත් කළ ලංසුව නිර්දේශ කර ඇත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් අභ්‍යන්තර ප්‍රවීණත්වය යොදා ගනිමින් ව්‍යාපෘතිය අවසන් කිරීමට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් ලංසු මිලෙන් සියයට 10 කට වඩා අඩු මුදලකට ව්‍යාපෘතිය නිම කිරීමට පරිපාලන තීරණයක් ගෙන තිබුණි. | අධිකාරිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. |